එසේ වුව ද පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එවැනි පුරප්පාඩුවක් ඇතිවුවහොත්, නව පාර්ලිමේන්තුව විසින්, ඒ පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ දින සිට එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා තෝරා පත් කර ගත යුත්තේ ය.

(ඇ) ධුරය එසේ හිස් වීමත් නව ජනාධිපතිවරයා ධුරයේ කාර්ය භාර ගැනීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය. අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම සඳහා ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයෙකු පත් කළ යුත්තේ ය :

එසේ වුව ද ඒ අවස්ථාව වන විට අග්‍රාමාත්‍ය ධුරය හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය.

(2) (32 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන හැර) ජනාධිපතිවරයාට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ කළ හැකිතාක් දුරට, වැඩ බලන ජනාධිපතිවරයකුට ද අදාළ වන්නේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය පිළිබඳ සියලු කරුණු සඳහා ද, ඊට අවශ්‍ය හා ආනුෂංගික වෙනත් සියලු කරුණු සඳහාද පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය.**

**41.** (1) ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලා සහ ඉටු කිරීමේ ලා තමාට සහාය දීම පිණිස තම මතය අනුව, අවශ්‍ය වන ලේකම්වරයන් පත් කිරීමට ද, අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා, වෙනත් නිලධරයන් සහ කාර්ය මණ්ඩලය පත් කිරීමට ද ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට ද ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

(2) ඒ ලේකම්වරයන්ගේ, නිලධරයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන්නේ ය.

(3) ඒ ලේකම්වරයන්, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීමේ සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ බලය ජනාධිපතිවරයා සතු විය යුතු වීම හැර ඒ ලේකම්වරයන්, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය රජයේ නිලධරයන් ලෙස සැලකිය යුත්තේ ය. එකී නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ බලතල ජනාධිපතිවරයා විසින් එවැනි යම් ලේකම්වරයකුට පවරනු ලැබිය හැක්කේ ය.

(4) නව ජනාධිපතිවරයකු ජනාධිපති ධුරය භාරගත් විට ඒ සෑම ලේකම්වරයකු ම, නිලධරයකු ම සහ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ධුර දැරීම අවසාන වන්නේ ය.